# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.23 පැය 1025 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/126 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම්</u>**

**01. 2025.01.22 වන දින පොලිස් විශේෂ කාර්‍ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාතර්‍ාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 31 | - | යතුරුපැදි 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධීව මෙරටට රැගෙන එන ලද දුම්වැටි සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.01.21 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මරදාන පොලිස් වසමේදී වැටලීමක් සිදු කර නීති විරෝධීව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 2000 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වූ කොළඹ 09 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය**

2025.01.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පිළියන්දල පොලිස් වසමේ මාම්පේ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මත්කරල් 1,400 ක් සමඟ

සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පිළියන්දල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන පිළියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ**

පිළියන්දල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා බුද්ධි කොට්ඨාසය

2025.01.23 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහබාගේ පොලිස් වසමේ, වැලිසර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 520 ක්, අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 280 ක් , යතුරුපැදියක් හා ජංගම දුරකථන 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහබාගේ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහබාගේ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 05. නීති විරෝධීව මෙරටට රැගෙන එන ලද දුම්වැටි සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා පුත්තලම කඳවුර.

2025.01.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුත්තලම පොලිස් වසමේ පාලවිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර නීති විරෝධිව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 15,800 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුත්තලම පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කල සැකකරුවකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා පුලියන්කුලම කඳවුර

2025.01.22 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නෙදුන්කේනී පොලිස් වසමේ රම්බෙකුලම් හන්දිය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවකු ටිපර් රථයද සමඟ අත්අඩංගුවට ගෙන නෙදුන්කේනි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන මුල්ලියාවෙලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නෙදුන්කේනි පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**